e- නැණ පියස e- නැණ පියස e- නැණ පියස

බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය

Zonal Education office - Balangoda

දෙවන වාර පරීක්ෂණය 7-ශ්‍රේණිය

Second Term Test Grade -7

සිංහල භාෂාව හා සාහිත්‍යය

Sinhala Language and Literature

කාලය පැය -02

Two Hour

**පළමු කොටසේ 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. පළමු වාර විභාගයේ ලකුණු අඩු වූ සිසුන්ට විදුහල්පතිතුමා දෙහි කැපුවේය.

   1. බැණ වැදුණේය 2. අවවාද දුන්නේය
   3. ප්‍රසංසා කළේය 4. තරවටු කළේය

2. සිරිදාස සමග කිසිම ඇයි හොඳයියක් පැවැත්විය යුතු නැතැයි අම්මා කීවාය.

   1. සුහදතාවක් 2. සම්බන්ධයක්
   3. විරුද්ධත්වයක් 4. තරහක්

3. ලොතරැයිය ඇදුණු පසු කමලාවතීගේ **කරල පැහිලා වගෙයි** ගම්මු නිතරම උසුළු විසුළු කළෝය.

   1. වාසියක් සිදුවීම 2. අසුවනු නෙළාගත් පසු
   3. අස්වනු පැසීම 4. අස්වනු සරුවීම

4. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

   1. ශිෂ්ඨාචාරය 2. ප්‍රස්ථාර
   3. කොට්ඨාෂය 4. විශිෂ්ට

5. මුලින් දී ඇති පදයට සමානාර්ථ නොදෙන පදය තෝරන්න.

   ජලය - 1 උදක 2 අඹ 3 භුවන 4 පැන්

6. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ දෙන පදය තෝරන්න.
ආගන්තුක - 1. ස්ථාවර 2. දූරස්ථ 3. නේවාසික 4. අනේවාසික

7. **පුස්ස බින්දා වගෙයි** යන ප්‍රස්තාව පිරුළට වඩාත් සමීප අර්ථය වන්නේ,
1. නිෂ්ඵල කාර්යයක් කිරීම 2. හිස් දෙයක් බිඳීම
3. පුස්සක් බිඳීම 4. නුසුදුසු දෙයක් කිරීම

**7-8 ප්‍රශ්න සඳහා යෙදිය හැකි තනි පදය තෝරන්න.**

8. කැඩුණු බිඳුණු දෙයක් නැවත පිළිසකර කිරීම
1. ප්‍රතිසංස්කරණය 2. ප්‍රතිෂ්ඨාපනය කිරීම
3. සංරක්ෂණය කිරීම 4. ප්‍රතිසංවර්ධනය කිරීම.

9. පහත යුගල පද සම්පූර්ණ කරන්න.
අඟුරු- .................................. වං-...........................

10. අවවාද යන පදය අයත් වන්නේ
1. නාම විශේෂණ 2. ක්‍රියා විශේෂණ
3. උපසර්ග 4. නිපාත

11. යංශය හා රකාරාංශය යෙදුන වචන දෙකක් ලියන්න

යංශය -..........................................

රකාරාංශය -...............................

12. **"ගියෙහු"** යන ආඛ්‍යාත පදය හා **"රකිති"** යන ආඛ්‍යාත පද සඳහා සුදුසු උක්ත පද දෙක ලියන්න.
ගියෙහු -................................ රකිති -................................................

13. පහත ඒකවචන පද බහු වචනයට හරවා ලියන්න.

පන්සල-....................................... පන්තිය-......................................................

14. පහත සඳහන් පදවල පුරුෂභේදය නම් කරන්න.
ඇතැම්හු -.................................
නිවේදිකාවක් -...............................

15. පහත වැකියේ ඇතුළත් ක්‍රියාපද නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,

නංගී මල් වට්ටිය **රැගෙන** මල් **නෙළමින්** වට්ටියට **දැමුවාය.**

1. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා 2. මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
3. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අනවසාන ක්‍රියා 4. පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා ,මිශ්‍ර ක්‍රියා

16. **සිනා කුමරි** පද්‍ය පන්තිය උපුටා ගෙන තිබෙන්නේ,

1. කෝමල රේඛා 2. රිදීම රේඛා 3. මනෝහාරී 4. සේපාලිකා

17. පහත කොටස සම්පූර්ණ කරන්න.

කුරුණෑගල යුගයේදී ........................ ඇමතිවරයාගේ ඉල්ලීමකට අනුව රචනා කරන ලද පන්සිය පනස් ජාතක පොතේ සැබවින්ම ඇත්තේ ජාතක කතා .................... කි.

18. පහත වාක්‍ය හරි නම් හරි ලකුණද, වැරදි නම් වැරදි ලකුණද යොදන්න.

ලෝකෝපකාරය වීදාගම හිමියන්ගේ නිර්මාණයකි. ( )

චාල්ස් ද සිල්වා මහතා සිරිගීය නමින් තිරුක්කුරල් ග්‍රන්ථය පරිවර්තනය කර තිබේ. ( )

19. පහත පදවල පොදු ව්‍යවහාරය ලියන්න.

තහංචිය -........................... මුත්තෙට්ටුව -...............................

20. පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

ගොවීහු ..................... (කුරුල්ලන් / කුරුල්ලෝ ) එළවති.

..................(නුඹ / නුඹලා ) ගමට ගියෙහු.

## II කොටස.

### 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. 3,4,5,6,7 ප්‍රශ්නවලින් තුනක් තෝරාගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

1. සිංහල විෂයට සම්බන්ධව ඔබ පන්තියේ සිසුන්ගේ නිර්මාණ ඇතුළත් කරමින් සකස් කරන ලද බිත්ති පුවත්පත කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ඔබ පන්තියේ සකස්කරන ලද බිත්ති පුවත්පතට යෙදූ නම කුමක්ද? ල.2

II. ඔම බිත්ති පුවත්පත සඳහා ඇතුළත් කරන ලද නිර්මාණ 2ක මාතෘකා ලියා දක්වන්න. ල.2

III. ඔය සකස් කිරීමේදී ඔබට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා 3 ක් ලියන්න. ල.3

IV. තමය සකස් කිරීමේදී ඔබට ගුරුතුමාගෙන් හෝ ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් 2ක් ලියන්න. ල.4

V. මේ සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ලද නිර්මාණය කුමක්ද? ල.2

VI. බිත්ති පුවත්පත සකස් කිරීමෙන් පසු ඔබේ ජීවිතයට ලැබුණු අද්දැකීම් 3 ක් කෙටියෙන් ලියන්න.ල.3

**02**. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 කට නො අඩු රචනයක් ලියන්න.

I. ක්‍රීඩාව නිරෝගී දිවියකට මග පාදයි.
II. නූතන තාක්ෂණය හා අධ්‍යාපනය
III. දිනෙන් දින ගිලිහී යන සාරධර්ම
IV. තරුණ පරපුර වනසන මත්ද්‍රව්‍ය
V. ජල සම්පත සුරකිමු. ලකුණු -14

**3.** පහත කරුණු ආශ්‍රය කර ගනිමින් ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

| | |
|---|---|
| ස්ථානය | - විද්‍යාලයීය ප්‍රධාන ශාලාව |
| ප්‍රධාන ආරාධිතයා | - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා |
| දිනය | - 2021.07.16 |
| වේලාව | - පෙව.10.30 |
| ආරාධනය | - දෙමාපියන්ට |
| කුමක් සඳහාද | - ශිෂ්‍යත්වලාභීන් වෙනුවෙන් ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රධානය කිරීම. |

ලකුණු-10

**4. ඇයි මෑණියනි, මම කුමන අන්‍යායක් කළෙම්ද ?**

I. මෙම ප්‍රකාශය කළ පුද්ගලයා කවුරුන්ද?
II. මෙම ප්‍රකාශය කාහට පවසන ලද්දක්ද?
III. මෙම කොටස ඇතුළත් පාඩමේ නම කුමක්ද?
IV. මෙම පාඩම උපුටා ගත් මුල් කෘතිය කුමක්ද?
V. එය රචනා වූයේ කිනම් යුගයකද? ලකුණු -10

**5.** මා වැනි <u>බිලින්දා</u>
වර වර ළගට කැන්දා
දුක් සැප කුමන්දා
අසන <u>නිරිඳෝ</u> වෙන කොයින්දා

I. මෙම කවියේ අර්ථය ලියන්න.
II. මෙය රචනා කළේ කවුරුන්ද?
III. ඉරි ඇඳි පද දෙකේ අර්ථය ලියන්න.
IV. මෙහි සඤ්ඤක අකුරක් සහිත වචනය කුමක්ද?
V. මෙම ක්වියේ ඇතුළත් උත්තම පුරුෂ අනුක්ත නාම පදය ලියා එහි උක්ත රූපය ලියන්න.

ලකුණු-10

**6.** පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

තඹ භාවිතය වසර 100000 ට පෙරාතුව තරම් ඈතට දිව යයි. නව ශිලා සමයේ ජීවත් වූ මිනිසා ගල් වෙනුවට තඹ යොදාගෙන ඇති අවස්ථා වාර්තා වෙයි. තඹවල විශේෂ ගුණ නම් ඒවා පහසුවෙන් නැමීම, දිගහැරීම, තැලීම කළහැකි වීමයි. එයින් වයර් තැනීම ප්‍රධාන කටයුත්තක් වෙයි. එසේ ම හොඳ විදුලි සන්නාහකයකි.

තඹ නිදුධි වර්ග දෙකකට බෙදා දැක්විය හැකිය. එනම් ඔක්සීකරණය වූ තඹ නිධි සහ ෂල්ෆයිඩ් තඹ නිධි ලෙසය. ඔක්සීකරණය වූ තඹ නිධිවන කප්රයිට් හා ටෙනොරයිට් තඹ නිධි පෝරණුවල කාබන් සමග දැවීමෙන් පහසුවෙන් ම තඹ ලෝහය බවට හැරවිය හැකිය. කැල්කොපයරයිට් හා කැල්කොසයිට් නිධි තඹ නිෂ්කාෂණයට පෙර සංකීර්ණ ක්‍රියාවලියකට හසුකළ යුතුය. මෙ බඳු නිධි ආර්ථික වශයෙන් ඉතා වැදගත්ය. ලොව ඇති තඹ නිධි වලින් අර්ධයක් ම කැල්කොපයරයිට් වර්ගයට අයත්ය.

තඹ නිධි සාරාගනු ලබන්නේ විවෘත වලවලින් හෝ භූමි අභ්‍යන්තරයේ දෝනා කැණීමෙනි. තඹ නිධියක අන්තර්ගත වන්නේ 15% ක තරම් අඩු ලෝහ ප්‍රමාණයකි. තඹ කැණිම ලාභදායක වන්නේ ඒවා විවෘත වලවලින් කැන්නහොත්ය.

a. තඹවල විශේෂ ගුණ මොනවද?
b. තඹ නිධි බෙදා දක්වන වර්ග දෙක මොනවාද?
c. ඡේදයට අනුව තඹ ලෝහය සාදාගන්නේ කෙසේද?
d. ලොව ඇති තඹ නිධිවලින් අර්ධයක් අයත් වන්නේ කිනම් වර්ගයකටද?
e. තඹ නිධියක කොපමණ ලෝහ ප්‍රමාණයක් අන්තර්ගතවේද?

ලකුණු -10

**7.** පහත සඳහන් වාක්‍යවලට සුදුසු උක්ත පද හා ආඛ්‍යාත පද ලියන්න.

I. ගංගාවෝ සාගර හිමි සොයා ගලා ............................................
II. වැද්දන් ඇටවූ උගුලට හාවෙක්..................................................
III. බල්ලෝ රාත්‍රියේ හඬට ....................................................................
IV. විදුහල්පතිතුමා සිසුන්ට අවවාද ලබා...........................................
V. ගස සුළඟට .......................................................................
VI. බුදුහිමියෝ භික්ෂූන් පිරිවරා දනට.............................................
VII. ............ ක්‍රිකට් තරඟයෙන් ජය ගත්තෙමු.
VIII. ..............................රෝගීන් සුවපත් කරති.
IX. සිසුහු දිනපතා පාසලට ................................................................

(ලකුණු -10)